# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

**විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීනී ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය විසින් 2020 ජනවාරි මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 දෙසැම්බර් මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[314 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2020 අංක  දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය.*

**2.** 1907 අංක 19 දරන විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" ලෙස හැඳින්වෙන) තුළ ඇති "මුස්ලිම්වරුන්ගේ විවාහ හැර සහ" යන වචන ඉවත්කිරීම සඳහා එම ආඥාපනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.*

**3.** 64 වන වගන්තියේ "විවාහය" පිළිබඳ අර්ථ නිරූපණය පහත දැක්වෙන වචනවලින් ආදේශ කරන්න:— "විවාහයක්" යනු "උඩරට විවාහ සහ දික්කසාද පනත හෝ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත යටතේ ගිවිසන ලද විවාහ හැර මෙමප්‍රඥප්තිය යටතේ ගිවිසන ලද කවර හෝ විවාහයක්".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ "විවාහය" පිළිබඳ අර්ථ නිරූපණය ආදේශ කිරීම.*

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*